නවයුගය


2005 මාර්තු
49 වසර 07 කලාපය



# තාක්ෂණික අධ්‍යාපනය ගැනයි...

අති ශීඝ්‍රයෙන් දියුණු වන තාක්ෂණයට සමාන්තර ලෙස ලෝකයේ හැම දෙයක් ම දිනෙන් දින වෙනස් වෙමින් පවතී. පරිගණක තාක්ෂණය, අන්තර්ජාලය, තොරතුරු තාක්ෂණය වෙනස් වන්නේ අදහා ගැනීමට නොහැකි තරම් වේගයෙනි. ඒ හා සමාන ලෙස ම රැකියා වෙළෙඳ පොළ ද අලුත් අවධියකට පත් වී ඇත.

මේ හේතුව නිසා රැකියා වෙළෙඳ පොළේ විශාල වශයෙන් රැකියා අවස්ථා මතු වී ඇත. එහෙත් ඒ සඳහා අවශ්‍ය සුදුසුකම් සහිත පුද්ගලයන්ගේ විශාල හිඟයක් පවතී. ඊට ප්‍රධාන හේතුව වී ඇත්තේ තාක්ෂණයේ දියුණුවත් සමඟ වෙනස් වන ලෝකයට ඔබින ආකාරයට අපේ අධ්‍යාපන ක්‍රමය වෙනස් නොවීම ය.



පාසල් තුළට තාක්ෂණික අධ්‍යාපනය හඳුන්වා දෙන්නට සැලසුම් කර ඇති බවට පුවත් පළ වූයේ අද ඊයේ නොවේ. එහෙත් පාසල්වලින් නූතන අවශ්‍යතාවන්ට අනුව තාක්ෂණික අධ්‍යාපනයක් ලැබෙන බවක් පෙනෙන්නට නැත. ඇතැම් පාසල්වලට පරිගණක උපකරණ ලබා දී ඇති බව සැබෑවකි. එහෙත් ඒවායින් නිසි ප්‍රයෝජනයක් දරුවන්ට ලබා දෙන්නට තරම් පරිගණක දැනුමක් සහිත ගුරුවරුන් සිටී ද?

සරසවිවල ද තත්ත්වය මෙය ය. ඒවායේ පාඨමාලා සකස් කෙරී ඇත්තේ එද ශ්‍රීමත් අයිවර් ජෙනිංස් ශ්‍රී ලාංකික සරසවි හඳුන්වා දුන් අවස්ථාවේ දැමූ අත්තිවාරම මත ය. ඇතැම් තැන්වල යම් යම් වෙනස්කම් සිදු කරමින් නූතන තාක්ෂණය හඳුන්වා දෙන්නට උත්සාහ ගෙන ඇතත් සම්ප්‍රදායික අධිපතිවාදීන්ගේ බලපෑම් නිසා ඒවා දියුණු කිරීම අසීරු වී ඇත. මේ ආදී හේතු ගණනාවක් නිසා සරසවිවලින් එළියට එන උපාධිධාරීන්ට රැකියා සොයා ගැනීම ඉතා දුෂ්කර කාර්යයකි. තිස් හතළිස් දහස් ගණන් උපාධිධාරීන්ට ආණ්ඩුවේ රැකියා සපයන්නට සිදු වී ඇත්තේ ඒ නිසා ය. ආණ්ඩුවේ කාර්යාලයක, දෙපාර්තමේන්තුවක කුරුටු ගෑමට වඩා දෙයක් කරන්නට ඔවුන් ලැබූ අධ්‍යාපනය ප්‍රමාණවත් නොවේ.




මේ තත්ත්වය හමුවේ නූතන තාක්ෂණය අලෙවි කිරීම දැන් හන්දියක් හන්දියක් පාසා සිදුවන්නට පටන්ගෙන ඇත. මේ තැන්වල උගන්වන තාක්ෂණය සමත්වන්නේ පරිගණකයෙන් අකුරු මුද්‍රණය සහ පිටු සැකසීම වැනි සීමිත කාර්යයකට පමණි. ඒ මට්ටම එද යතුරුලියනය උගෙන ගත් අයෙකු කළ ප්‍රමාණයට වඩා වැඩි නොවේ. එහෙත් මේ පිළිබඳ නිසි අවබෝධයක්, දැනීමක් නැති බොහෝ මවුපියෝ මෙන් ම දරු දැරියෝ ද මේ හන්දි ගණනේ හතු පිපෙන්නාක් මෙන් බිහි වන පරිගණක අධ්‍යාපන කඩවල ප්‍රචාරයන්ට ගොදුරු වෙති. ඒවායින් ලබන අධ්‍යාපනය රැකියාවකට ප්‍රමාණවත් නොවන බව දැන ගන්නේ දස දහස් ගණනින් මුදල් වියදම් කළාට පසු ය. මේ තත්ත්වය පිළිබඳ සමාජය පුළුල් ලෙස දැනුම්වත් කිරීමේ අවශ්‍යතාවක් අද මතු වී ඇත. තම දූ දරුවන්ට නූතන තාක්ෂණික දියුණුව සමඟ කරට කර සිටින්නට හැකි තාක්ෂණික අධ්‍යාපනයක් ලබා දෙන්නට මවුපියන්ට ඇති වුවමනාවත්, රැකියා පෝලිම්වල ලගින්නේ නැතිව රැකියාවක් සොයා ගැනීමේ අනාගත අපේක්ෂාව ඇති දරුවන්ටත් ඒ සඳහා සුදුසු පෞද්ගලික හා රාජ්‍ය ආයතන ගණනාවක් ම අද දිවයිනේ බිහි වී ඇත. එමෙන්ම කාර්මික අංශයෙන් විවිධ පාඨමාලා උගන්වන, ඒ අංශවල දක්ෂයන් බිහි කිරීමට හැකි මට්ටමේ කාර්මික අධ්‍යාපනයක් ලබා දෙන රාජ්‍ය ආයතන කිහිපයක් ම ඇත. ඒවායේ අධ්‍යාපනය ලැබීමට එ තරම් මුදලක් වැය නොවේ. ඇතැම් එබඳු ආයතන පාඨමාලා හදාරන කාලයේ දී සිසු සිසුවියන්ට ගමන් වියදම් දීමනා ද ගෙවනු ලැබේ.



එහෙත් පරිගණක තාක්ෂණය ආශ්‍රිත උසස් සහ දියුණු පාඨමාලා උගන්වන පෞද්ගලික අධ්‍යාපන ආයතනවල අධ්‍යාපනය ලැබීමට නම් යම් මුදලක් වැය වේ. ඒ මුදල් කොටස් වශයෙන් ගෙවීමට පහසුකම් ද ඒ ආයතන මඟින් සලසා ඇත. ඒවායේ අධ්‍යාපනය ලැබීමෙන් පසු දෙස් විදෙස් රැකියා ලබා ගැනීමේ අවස්ථාව දරු දැරියන්ට හිමි වේ. මෙහිදී ප්‍රශ්න කිහිපයක් මතු වේ. පළමු වැන්න මේ අධ්‍යාපනය දරුවන්ට ලබා දෙන්නට වැය කිරීමට අවශ්‍ය මුදල් මවුපියන් සතු නොවීම ය. මෙහි දී රජයට මැදිහත් විය හැකි ය. රජය මඟින් ඒ මුදල සම්පූර්ණයෙන් හෝ අර්ධ වශයෙන් හෝ ගෙවීම එක් ආකාරයකි. නැති නම් බැංකු මඟින් සහන ණය මුදලක් ලෙස ලබා දීමට රජය මැදිහත්වීම තවත් ආකාරයකි. බොහෝ රටවල අද මෙබඳු ක්‍රම ක්‍රියාත්මක වේ. මේ පාඨමාලා තම දරුවන්ගේ අනාගතය සරු කර ගැනීමට ඉවහල් වේ ද නැති ද යන ප්‍රශ්නය බොහෝ මවුපියන් තුළ මතු වන්නේ ඔවුන්ගේ නොදැනුවත්කම නිසා ය. ඒ ප්‍රශ්නයට ද මැදිහත් වන්නට රජයට හැකි ය. ඒ ඒ ආයතනවල පාඨමාලාවල ඇති වටිනාකම, ගුණාත්මක බව, තාක්ෂණික මට්ටම ආදිය පිළිබඳ සහතික කිරීමට රජයට හැකි ය. එ මෙන් ම මේ අධ්‍යාපන ආයතනවල ඇති පාඨමාලා දරුවන්ට හඳුන්වා දෙන්නට මැදිහත් වීම ද රජයට කළ හැකි දෙයකි. රාජ්‍ය මාධ්‍ය ආයතන ඒ සඳහා යොදා ගැනීමට හැකි ය. අනුග්‍රාහක දායකත්වය ඒ ඒ ආයතනවලින් ලබා ගැනීමට හැකි ය.

මේ ආදී වශයෙන් කළ යුතු කළ හැකි වැඩ බොහෝ ය. ඒ සඳහා කඩිනම් සහ ඵලදායී මැදිහත් වීමක් රජය මඟින් කළ යුතු ය.




# උසස් අධ්‍යාපනයට අත්වැලක්

"දැන ගියොත් කතරගම, නොදැන ගියොත් අතරමග" කීවාක් මෙන් වත්මන් ලොව රැකියා අවස්ථා සෙවීම ද නොදැන ගියොත් අතරමං වන ගමනකි. කාලයත්, ශ්‍රමයත්, මුදලත් අපතේ යවමින් විවිධ පාඨමාලා පසු පස හඹා ගොස්, රැකියාවක් නොමැතිව සුසුම්ලනවාට වඩා, තම හැකියාවන් අවබෝධ කරගනිමින් ඊට ගැලපෙන තමා ප්‍රිය කරන ක්ෂේත්‍රයකට අදාළ පාඨමාලාවකට යොමු වුවොත්, නිසි තැනට පත්ව ඔබ ජය ගනු ඒකාන්ත ය. සැබැවින් ම මෙම ගමන ඇරඹිය යුත්තේ පාසල් වියේ සිට ම ය. අ.පො.ස (සා.පෙළ) විභාගයට පෙනී සිටින සිසු සිසුවියන් උසස් පෙළ විෂයයන් තෝරාගත යුත්තේ, තමාට, තමා අනාගතයේ බලාපොරොත්තු වන රැකියාවට උචිත ලෙසට ය. උසස් පෙළ සමත් වී විශ්වවිද්‍යාල පිවිසුම් වරම් ලැබුව ද ඇතැම් ක්ෂේත්‍රයන් හී දී විශ්වවිද්‍යාල උපාධිය තිබූ පමණින් ම රැකියා අවස්ථා හිමි කර ගැනීම උගහට ය. එයට හේතුව අද අප රට තුළ රැකියා හිඟවීම නොව අදාළ රැකියා ක්ෂේත්‍රයන් සඳහා සුදුසුකම් ඇත්තන් නොමැති වීම ය. මේ වාතාවරණය හමුවේ, අ.පො.ස.(සා.පෙළ) හෝ (උ.පෙළ) විභාගයට සිංහල හෝ ඉංග්‍රීසි මාධ්‍යයෙන් පෙනී සිටින සිසු සිසුවියන්ට තමා කැමති රැකියාවන් සහිත ක්ෂේත්‍රයක පාඨමාලා හැදෑරීම සඳහා අවස්ථාව උදා කර දීමට, බොහෝ ආයතන අද ඉදිරිපත් වී සිටී.

[illegible] ද ආරම්භ වූ "Royal Institute" ආයතනය එද මෙද තුර තිස් වසකට අධික කාලයක් මුළුල්ලේ ද්විතීයික හා තෘතීයක අධ්‍යාපන ක්ෂේත්‍රයන්හි ක්‍රියාකාරී මෙහෙවරක් ඉටු කරමින් සිටී.

මෙරටට පරිගණක පාඨමාලා හඳුන්වා දුන් සීමිත වූ මූලාරම්භකයන් අතරට මෙම ආයතනය ද එක් වේ.

1990 දී ලන්ඩන් විශ්ව විද්‍යාලයය හා අනුබද්ධිත විද්‍යාවේදී උපාධි පාඨමාලා ආරම්භ කළ ඔවුන් මේ වන විට උපාධි පාඨමාලා 13 ක් අරඹා තිබේ. 1989 වසරේ දී පිහිටුවනු ලැබූ ඉංග්‍රීසි අධ්‍යාපන අංශය ද අද වන විට සිසු සිසුවියන් අතර අතිශය ජනප්‍රියත්වයට පත්ව තිබේ. පරිගණක පාඨමාලා අංශය ද පහසුකම් රැසකින් සමන්විත ය.

සාමාන්‍ය පෙළ (O/L) හෝ උසස් පෙළ(A/L) විභාගයට පෙනී සිට, ඉක්මනින්, වඩා හොඳ රැකියා අවස්ථාවක් හිමි කර ගැනීමට අපේක්ෂා කරන ඔබට, මෙම ආයතනය මඟින් මෙහෙයවනු ලබන විද්‍යාවේදී උපාධි පාඨමාලා පෙළ ඉතා වැදගත් වේ. මෙහිදී තමා අපේක්ෂා කරන රැකියා අවස්ථාවට ළඟා විය හැකි උපාධි පාඨමාලාවක් තෝරා ගැනීම ඔබේම යහපත පිණිස වනු ඇත.

## උපාධි පාඨමාලා සඳහා ඇතුළත් වීමේ සුදුසුකම්

* අයැදුම්කරුවන්, වයස අවු. 17 සම්පූර්ණ වූවන් විය යුතුය.
* අ.පො.ස. (උ.පෙළ - ලන්ඩන්) විෂයන් දෙකක් සමත්වීම සහ අ.පො.ස. (සා.පෙළ - ලන්ඩන්) අවම වශයෙන් විෂයන් තුනක් සඳහා "C" සමාර්ථයන් ලබා තිබීම.
* අ.පො.ස. (උ.පෙළ - ලන්ඩන්) විෂයන් තුනක් සමත්ව තිබීම සහ අ.පො.ස. (සා. පෙළ - ලන්ඩන්) අවම වශයෙන් එක් විෂයක් සඳහා "C" සාමාර්ථයක් ලබා තිබීම (හෝ අ.පො.ස. (සා.පෙළ) ඉංග්‍රීසි සහ ගණිතය ඇතුළු විෂයයන් හතරකට C සාමාර්ථ ලබා තිබීම)
* අ.පො.ස. (උ.පෙළ) ශුද්ධ ගණිතය සහ ව්‍යවහාරික ගණිතය විෂයන්ට අවම වශයෙන් "C" සාමාර්ථ ලබා තිබීම සහ අ.පො.ස. (සා.පෙළ) එක් විෂයක් සඳහා හෝ "C / D" සාමාර්ථයක් ලබා තිබීම.
* ගණිත විෂයයන් හැරුණු විට, අ.පො.ස. (උ.පෙළ) සඳහා "C" සාමාර්ථ 3 ක් ලබා තිබීම සහ අ.පො.ස. (සා.පෙළ) එක් විෂයක් සඳහා හෝ "C / D" සාමාර්ථයක් ලබා තිබීම.
* ලන්ඩන් විශ්ව විද්‍යාලයට පිළිගත හැකි විශ්ව විද්‍යාලයක උපාධියක් ලබා තිබීම.
* පහත සඳහන් ආයතනවල සාමාජිකත්වය දැරීම

(1) Chartered Institute of Management Accountants (CIMA)
(2) Institute of Chartered Accountants
(3) Institute of Chartered Secretaries and Administrators
(4) Chartered Institute of Bankers
(5) Solicitors of English and wales etc

**පාඨමාලා සුදුසුකම්**

LLB- මේ සඳහා වෙනත් පාඨමාලා අවශ්‍ය නොවේ.

පරිගණක හා තොරතුරු පද්ධති විද්‍යාවේදී උපාධිය :- (BSC Computing and Information Systems)

ගණිත විෂයන් ගෙන් අ.පො.ස (උ.පෙළ) සමත්වීම හෝCIS සඳහා පමණක් නම් (උ.පෙළ) භෞතික විද්‍යා විෂයC සාමාර්ථයක් ලබා තිබීම.

**වෙනත් සියලුම උපාධි සඳහා**

අ.පො.ස. (සා.පෙළ - ලන්ඩන්) ගණිත විෂය C ශ්‍රේණියේ හෝ ඉහළ සාමාර්ථයක් ලබා තිබීම (හෝ අ.පො.ස (සා.පෙළ) ගණිත විෂය සඳහා C සාමාර්ථයක් ලබා තිබීම.)

**විභාග**

උපාධි පාඨමාලා සඳහා විභාග පැවැත්වෙන්නේ සෑම වසරකම මැයි / ජූනි මාසවල දී ය. සියලුම විභාග හසුරවනු ලබන්නේ ලන්ඩන් විශ්ව විද්‍යාලය මඟිනි.

**අධ්‍යාපන රටාව**

දේශන, පත්‍රිකා, කරුණු අධ්‍යයනය, පැවරුම්, වීඩියෝ දර්ශන සහ කණ්ඩායම් සාකච්ඡා මඟින් අධ්‍යාපනය සිදු කෙරේ. පළපුරුදු දේශකයන්ගේ සහාය ලබා ගැනේ.

**පාඨමාලා කාල සීමාව**

ඕනෑම උපාධි පාඨමාලාවක් සඳහා අවම කාල සීමාව වසර 3 කි. ඒකක හතරක් දක්වා අමතර සුදුසුකම් ලබන සිසුන් සඳහා එය දෙවසරකට සීමා විය හැකිය.

**අධ්‍යාපන උපකරණ**

අධ්‍යාපන කටයුතුවලට උදව්දීමට අමතරව සියලුම ලියාපදිංචි සිසුන් වෙනුවෙන් අත්පොත්, උපදෙස් පොත්, විෂය නිර්දේශ අත්පොත් පසුගිය ප්‍රශ්න පත්‍ර ආදිය ලන්ඩන් විශ්ව විද්‍යාලය මඟින් සැපයෙනු ඇත.

**අයැදුම්පත්**

* උපාධි පාඨමාලා සඳහා අවශ්‍ය අයැදුම්පත්, උපාධි පාඨමාලා සම්බන්ධීකාරක, නො. 36, වෝඩ්ප්ලේස්, කොළඹ 7 යන ස්ථානයෙන් හෝ උපදේශක, නො 191, හැව්ලොක් පාර, කොළඹ 05 යන ස්ථානයෙන් ලබාගත හැකි ය. එක් එක් පාඨමාලාව අනුව අය කරන මුදල ද වෙනස් වේ.

### *BSC Computing and Information Systems - පරිගණක විද්‍යාව හා තොරතුරු පද්ධති (විද්‍යාවේදී) උපාධි පාඨමාලා*

අදියර තුනකින් යුතු මෙහි පාඨමාලා කාලය වසර 3 කි. ක්ෂේත්‍රයේ වඩාත් පිළිගැනීමක් සහිත උපාධියකි.

**ඇතුළත්වීමේ සුදුසුකම්**

* ගණිත විෂයෙන් අ.පො.ස (උ.පෙළ - ලන්ඩන්) සමත්වීම
* ගණිත විෂයෙන් අ.පො.ස (උ.පෙළ) සමත්වීම හෝ භෞතික විද්‍යාව සඳහා "C" සාමාර්ථයක් ලබා ගැනීම

**විශේෂ සුදුසුකම්**

*NCC ජාත්‍යන්තර ඩිප්ලෝමාව - ගෞරව සාමාර්ථයක් ලබා තිබීම
* IDPM ඩිප්ලෝමාව - විශිෂ්ට(merit)සාමාර්ථයක් ලබා තිබීම
*IDPM (Higher) ඩිප්ලෝමාව

### *BSC Economics - ආර්ථික විද්‍යා (විද්‍යාවේදී) උපාධි පාඨමාලාව*

ආර්ථික විද්‍යාව, කළමනාකරණය, සහ සමාජ විද්‍යාව ප්‍රිය කරන සිසුන්ට මේ උපාධිය විශේෂිත වේ. ව්‍යාපාර, වානිජ, කර්මාන්ත සහ බැංකු හෝ පරිපාලන ක්ෂේත්‍රයන්හි රැකියා අවස්ථා සඳහා දොරටු විවර කෙරෙන උපාධියකි.

**පාඨමාලා ව්‍යුහය**

අනිවාර්යවූත් වෛකල්පිත වූත් ඒකක ගණනාවකින් සමන්විතය. මූලික ඒකක(Foundation Units) 4 ක් සහ සියලුම අනිවාර්ය ඒකක ඇතුළු ඒකක 12 ක් විභාගය සඳහා පෙනී සිටීමට අවශ්‍ය වේ. උපාධිය හිමිකර ගැනීමට සහ ගෞරව උපාධි තිළිණනයට යොමුවීම සඳහා හොඳ සාමාන්‍යයක් සහිතව අවම වශයෙන් විභාග ඒකක 11 ක් සමත් විය යුතු ය.

### *BSC Economics and Managements - ආර්ථික විද්‍යාව සහ කළමනාකරණ (විද්‍යාවේදී) උපාධි පාඨමාලාව*

කර්මාන්ත, මූල්‍ය හෝ සිවිල් සේවයේ ආර්ථික විද්‍යාඥයකු ලෙස රැකියා අවස්ථා මෙන්ම ගණකාධිකාරී, බැංකු සේවය, සාමාන්‍යාධිකාරී වැනි තනතුරු සඳහා ද ආර්ථික විද්‍යාව හැදෑරීම වැදගත් වේ.

සිද්ධාන්ත පිළිබඳ මූලික අධ්‍යාපනය, කළමනාකරණ පුහුණුව සහ ආර්ථික විද්‍යා විශේෂඥතාව මෙම උපාධියේ අරමුණු ය.

පාඨමාලා ව්‍යූහය

ආර්ථික විද්‍යා විද්‍යාවේදී උපාධියට සමානය.

**BSC Business** - *ව්‍යාපාර (විද්‍යාවේදී) උපාධි පාඨමාලාව*

2002 වසරේ දී හඳුන්වා දුන් නවතම උපාධි පාඨමාලාවක් වූ මෙය, අතිශය තරඟකාරී වූ ව්‍යාපාර ලෝකයට සිසුන් සූදානම් කරවීම සඳහා ආරම්භ වූවකි. ව්‍යාපාර පුහුණුව, උපදේශක සේවය සහ පර්යේෂණ යන ඒකකවලින් පාඨමාලාව සමන්විත ය.

**BSC Management** - *කළමනාකරණ (විද්‍යාවේදී) උපාධි පාඨමාලාව*

උපාධියේ අරමුණු

* සමාජ විද්‍යා සිද්ධාන්ත සහ පුහුණුව පිළිබඳ විශේෂ අවධාරණයකින් යුතුව, කළමනාකරණ උපාධිය පිරිනැමීම.
* වානිජ, කර්මාන්ත සහ අධ්‍යාපන ක්ෂේත්‍රයන්හි වෘත්තීය අවස්ථා පුළුල් වනසේ කළමනාකරණ ක්ෂේත්‍රයේ විෂයයන් රැසක් ඉගැන්වීම
* ජාත්‍යන්තර කළමනාකරණ පිළිබඳ දැනුම හා අවබෝධය ලබා දීම

පාඨමාලා ව්‍යූහය

ආර්ථික විද්‍යා විද්‍යාවේදී උපාධියට සමානය

**BSC Accounting and Finance** - *ගණකාධිකරණය සහ මූල්‍ය (විද්‍යාවේදී) උපාධි පාඨමාලාව*

උපාධියේ අරමුණු

*ශක්තිමත් සමාජ විද්‍යා රාමුවක් තුළ සිට ගිණුම්කරණය හා මූල්‍ය කටයුතු පිළිබඳ දැනුම සැපයීම.

* මෙහි විෂයයන් මඟින් ඉලක්ක කෙරෙන්නේ, ගිණුම්කරණය සහ මූල්‍ය කටයුතු පිළිබඳ අවබෝධය තිබිය යුතු විවිධ රැකියා අවස්ථා සඳහා අත්‍යවශ්‍ය හැකියාවන්, ශිෂ්‍යයන් විසින් හදරන බවට සහතික කිරීම ය.
* ජාත්‍යන්තර මට්ටමින් පිළිගන්නා සහතිකයකි.

පාඨමාලා ව්‍යූහය

කළමනාකරණ විද්‍යාවේදී උපාධි පාඨමාලාවට සමානය

**BSC Banking and Finance** - *බැංකු කටයුතු හා මූල්‍ය (විද්‍යාවේදී) උපාධි පාඨමාලාව*

කාර්යක්ෂම ආර්ථික සංවර්ධනය සඳහා, මූල්‍ය ආයතන කළමනාකරණය රජයේ එක් වැදගත් කාර්යභාරයකි. මූල්‍ය සම්පත් සහ එම



සම්පත් ලබාගත හැකි මූල්‍ය ආයතන තත්ත්වයන් හැදෑරීම මෙම උපාධියේ මූලික අරමුණයි. මූල්‍ය හා කාර්මික ආර්ථිකය පිළිබඳ දැනුම මෙහිදී ලැබෙනු ඇත. මූල්‍ය ආයතනවල සේවාදායකයන්ට උපාධිධාරීන්ගෙන් ලබාගත හැකි සේවය ඉතා වටිනා නිසාවෙන් මූල්‍ය ආයතනවල මෙන්ම රාජ්‍ය අංශයේද ඔවුන්ගේ වෘත්තිය අවස්ථා වැඩි වනු ඇත.

පාඨමාලා ව්‍යූහය

කළමනාකරණ (විද්‍යාවේදී) උපාධි පාඨමාලාවට සමානය

**BSC Information Systems and Management** - *තොරතුරු පද්ධති සහ කළමනාකරණ (විද්‍යාවේදී) උපාධි පාඨමාලාව*

පසුගිය දශකය පුරා තොරතුරු තාක්ෂණයේ වර්ධනය අතිශය ව්‍යාප්ත වී ඇති අතර තොරතුරු තාක්ෂණයෙන් තොර මානව ක්‍රියාකාරකම් පිළිබඳ සිතාගැනීමට පවා අසීරු ය. තොරතුරු හැසිරවීම ඉතා සංකීර්ණ ක්‍රියාවලියක් වන අතර, අත්‍යවශ්‍ය දැනුම ලබා තිබීම වැදගත් ය.

කර්මාන්ත මෙන්ම රාජ්‍ය ක්ෂේත්‍රයන් ගේ ද කළමනාකරණ මෙවලමක් ලෙස බහුල වශයෙන් පරිගණක භාවිතය සිදු වේ. එබැවින් මෙම උපාධිය වර්තමාන රැකියා අවස්ථාවන්ට උචිත වනු ඇත. කළමනාකරණ අංශය, පරිපාලන අංශය, පරිගණක හා තොරතුරු පද්ධති වැනි පුළුල් ක්ෂේත්‍රයක වෘත්තිය අවස්ථා මෙ මඟින් උදාකරගත හැකි ය.

පාඨමාලා ව්‍යූහය

කළමනාකරණ විද්‍යාවේදී උපාධි පාඨමාලාවට සමානය

**BSC Management with Law**- *කළමනාකරණ සහ නීතිය (විද්‍යාවේදී) උපාධි පාඨමාලාව*

බාහිර සිසුන් සඳහා, කළමනාකරණ සහ LLB උපාධි පාඨමාලාවල විෂයමාලාවන් සමඟ මෙම උපාධිය සම්බන්ධිත ය. කළමනාකරණය හා නීතිය සංයෝජනයෙන් විචාරාත්මක හා සිද්ධාන්තික අධ්‍යාපනය හැදෑරීම සඳහා අවස්ථාව සැලසේ.

කළමනාකරණ හා නීති විෂයයන් හැදෑරීමෙන්, ජාත්‍යන්තර කළමනාකරණය ක්ෂේත්‍රයේ විශාල පරාසයක් පිළිබඳ දැනුම හා අවබෝධය ශිෂ්‍යයන් හට ලැබෙනු ඇත.

**BSC. Law with Management** - *නීතිය සහ කළමනාකරණය (විද්‍යාවේදී) උපාධි පාඨමාලාව*

කළමනාකරණය හා නීතිය විද්‍යාවේදී උපාධි පාඨමාලාවට සමානය. නමුත් පාඨමාලා දෙකෙන් ආවරණය වන්නේ කළමනාකරණ හා නීති විෂයන්හී විවිධ වූ ක්ෂේත්‍රයන් ය.

**BSC. Accounting with Law** - *ගණකාධිකරණය හා නීතිය (විද්‍යාවේදී) උපාධි පාඨමාලාව*

ගණකාධිකරණය හා මූල්‍ය විද්‍යාවේදී පාඨමාලාව සහ LLB උපාධි පාඨමාලාවල විෂය මාලාවන් හා සම්බන්ධිත ය. රාජ්‍ය සහ පෞද්ගලික අංශ දෙකෙහිම රැකියා අවස්ථා විවර වන උපාධියකි. ගණකාධිකරණ විෂයයන් මඟින්, ගණකාධිකරණ හා මූල්‍ය කටයුතු පිළිබඳ අවබෝධයක් අවශ්‍ය විවිධ රැකියා අවස්ථා සඳහා හැකියාවන් වර්ධනය කෙරෙන අතර, එම ක්ෂේත්‍රයන්හී උද්ගතවන නීතිමය කටයුතු සඳහා නීති විෂයයන් මඟින් දැනුම ලබා දෙනු ඇත.

**LLB** *උපාධි පාඨමාලාව*

ලන්ඩන් විශ්ව විද්‍යාලය හා අනුබද්ධිත LLB උපාධි පාඨමාලාව ජාත්‍යන්තර පිළිගැනීමක් සහිත ය. නූතන අවශ්‍යතාවන්ට ගැලපෙන පරිදි විද්වත් නීතිඥ මණ්ඩලයක් මඟින් මෙය සැලසුම් කර තිබේ.

මෙම ගරුකටයුතු උපාධියට හිමිකම් කියන්නන්ට, ආයතනික නීතිඥයන් ලෙස කළමනාකරණ හා පරිපාලන අංශයන්හී පුළුල් රැකියා අවස්ථා උදා වනු ඇත. එසේම ජාත්‍යන්තර මට්ටමේ නීතිමය හා නීතිමය නොවන වෘත්තිය පාඨමාලා හැදෑරීමට ද අමතර සුදුසුකමක් හිමිවනු ඇත.

අමතර පහසුකම්

ඇතුළත් වීමේ විභාගයට පෙනී නොසිට ශ්‍රී ලංකා නීති විද්‍යාලයට ඇතුළුවීමේ අවස්ථාව හිමි වීම

නීති විද්‍යාල පාඨමාලාව වඩාත් ඉක්මනින් නිම කිරීමට සහ නීතිඥයකු ලෙස සුදුසුකම් ලැබීමට අවකාශ සැලසීම. ❑